# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1820/15 — 2013 ජූලි මස 24 වැනි බදාදා - 2013.07.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

මගේ අංකය: 01/10/03/04.

**ඌව පළාතේ පළාත් සභාව**

ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ඌව පළාත් සභාව

ඌව පළාත් ආණ්ඩුකාරවර ගරු සී. නන්ද මැතිව් මැතිතුමා විසින් පහත සඳහන් පත්කිරීම් සිදු කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

01. ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ආර්. එම්. ටී. බී. හාතියල්දෙණිය මහතා 2013.05.26 දින සිට 2013.06.03 දින දක්වා විදේශ ගත වන බැවින්, 2013.05.26 දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ නිළධාරිනි ආර්. ඒ. එච්. ඒ. සමරසිංහ මහත්මිය, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තනතුරේ වැඩ බැලීමට.

02. ඌව පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ එම්. එම්. ජේ. එස්. විජේකෝන් මහතා 2013.05.29 දින සිට 2013.06.30 දින දක්වා විදේශ ගත වන බැවින්, 2013.05.29 දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරී ඩී. එම්. ආර්. ධනපාල මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

03. ඌව පළාත් මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (අයවැය) ආර්. ටී. එස්. එල්. ජයසිංහ මහතා 2013.05.27 දින සිට 2013.06.02 දින දක්වා විදේශ ගත වන බැවින්, 2013.05.27 දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ නිලධාරි එච්. ඩී. සී. පී. ජයරත්න මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාත් මූල්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (අයවැය) තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

04. ඌව පළාත් මාර්ග අධ්‍යක්ෂ ඒ. ඒ. පී. එස්. කේ. කරුණාරත්න මහතා 2013.06.07 දින සිට 2013.07.01 දින දක්වා විදේශ ගත වන බැවින්, 2013.06.07 දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරී ඩී. චන්ද්‍රතිලක මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාත් මාර්ග අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

05. ඌව පළාත් ආදායම් කොමසාරිස් ඩබ්. එම්. කරුණාතිලක මහතා 2013.06.15 වැනි දින සිට 2013.06.21 වැනි දින දක්වා විදේශ ගතවන බැවින්, 2013.06.15 වැනි දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, නියෝජ්‍ය පළාත් ආදායම් කොමසාරිස් එන්. ඒ. සමරජීව මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාත් ආදායම් කොමසාරිස් තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.


1A - PG 001697 — 360 (2013/07)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

06. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ නිලධාරී සුමිත් සුරවීර මහතා 2013.06.18 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් තනතුරින් ඉවත් කර ඌව පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලයට අනුයුක්ත කිරීමට.

07. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ ආර්. එම්.ටී. බී. හාතියල්දෙණිය මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව 2013.06.19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම් තනතුරේ වැඩ බැලීමට,

08. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියේ විශ්‍රාමික නිලධාරී ආර්.එම්. හේමචන්ද්‍ර බණ්ඩාර මහතා 2013.07.01 වැනි දින සිට ඌව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස් තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2014.06.30 වැනි දින හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් එම තනතුරේ කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට,

09. ඌව පළාතේ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම් එල්. එල්. අනිල් විජේසිරි මහතා 2013.06.30 දින සිට 2013.07.08 දින දක්වා විදේශ ගත වන බැවින්, 2013.06.30 දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ නිලධාරිනි ජී. ඒ. එම්. එස්. පී. අඹන්වල මහත්මිය, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාතේ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම් තනතුරේ වැඩ බැලීමට,

10. ඌව පළාතේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ (ඌව) ආර්. එම්. ආරියදාස මහතා 2013.07.09 දින සිට 2013.09.14 වැනි දින දක්වා විදේශ ගතවන බැවින්, 2013.07.09 වැනි දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරී වෛද්‍ය එස්. කේ. වීරසුන්දර මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාතේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ (ඌව) තනතුරේ වැඩ බැලීමට,

11. ඌව පළාතේ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ගුණදාස සමරසිංහ මහතා 2013.06.30 දින සිට 2013.07.08 දින දක්වා විදේශ ගත වන බැවින්, 2013.06.30 දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ නිලධාරී එච්. පී. ඒ. ජී. අනුරුද්ධ මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාතේ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, සංස්කෘතික කටයුතු, ප්‍රවාහන, ඉඩම්, වාරිමාර්ග, ආර්ථික ප්‍රවර්ධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරේ රාජකාරී ඉටු කිරීමට,

12. ඌව පළාත් ඉඩම් කොමසාරිස් ගුණදාස සමරසිංහ මහතා 2013.06.30 වැනි දින සිට 2013.07.08 වැනි දින දක්වා විදේශ ගතවන බැවින්, 2013.06.30 වැනි දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ නිලධාරී ටී. ඩබ්. ගයාන් මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව, ඌව පළාත් ඉඩම් කොමසාරිස් තනතුරේ රාජකාරී ඉටු කිරීමට,

13. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ නිලධාරී ගුණදාස සමරසිංහ මහතා, 2013.07.09 වැනි දින සිට ඌව පළාතේ මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, පාරිභෝගික කටයුතු හා සමුපකාර සහ ආහාර සැපයීම් හා බෙදාහැරීම් අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් පත්කිරීමට,

14. ඌව පළාතේ මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, පාරිභෝගික කටයුතු හා සමුපකාර සහ ආහාර සැපයීම හා බෙදාහැරීම් අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් පත්කර ඇති ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ නිලධාරී ගුණදාස සමරසිංහ මහතා, 2013.07.09 වැනි දින සිට තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාතේ ඉඩම් කොමසාරිස් තනතුරේ වැඩ බැලීමට,

15. ඌව පළාත් සභා ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (සැලසුම්) එම්. එම්. ආනන්ද විජිත කුමාර මහතා 2013.06.30 වැනි දින සිට 2013.07.08 වැනි දින දක්වා විදේශ ගත වන බැවින්, 2013.06.30 වැනි දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ III වන පන්තියේ නිලධාරී එම්. රත්නකුමාර් මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව, ඌව පළාත් සභා ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරේ රාජකාරී ඉටු කිරීමට.

එච්. එම්. සෝමතිලක,
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්.

රජ වීදිය,
බදුල්ල,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

08 - 339

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.